# සමූපකාර සේවක කොමිෂන් සභාව (දකුණු පළාත)
## கூட்டுறவு ஊழியர் ஆணைக்குழு (தென் மாகாணம்)
## Co-operative Employees Commission (Southern Province)

සැලසුම් ලේකම් කාර්යාලයීය ගොඩනැගිල්ල (1 වන මහල), එස්. එච්. දහනායක මාවත, ගාල්ල.
திட்டமிடல் செயலாளர் அலுவலக் கட்டிடம் (1ம் மாடி), எஸ்.எச், தஹநாயக மாவத்தை, காலி.
**Planning Secretariat Building (1 st Floor), S. H. Dahanayaka Mawatha, Galle.**


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. } SP/CEC/1/O/5 | ඔබේ අංකය / உனது இல / Your No. } | දිනය / திகதி / Date } 2023.05.04 |

චක්‍රලේඛ අංක 1/2023

දකුණු පළාතේ සියලුම සමූපකාර සමිති සභාපතිවරුන් වෙත,

**<u>විනය පරීක්ෂණ හා තීරක විභාගවලදී සමිතියේ නියෝජිතයන් වශයෙන් පෙනී සිටින අයට ගෙවීම් කිරීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කර ඇති 4/92 චක්‍ර ලේඛය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එම චක්‍රලේඛයේ සඳහන් උපදෙස් පහත පරිදි සංශෝධනය කිරීමට කොමිෂන් සභාව තීරණය කර ඇත.

**(අ) සේවකයන්ගේ දිනක වැටුප රු.700/-ක් හෝ ඊට අඩුවන්නේ නම්,**

I. දින 04 ක උපරිමයකට යටත්ව පැය 04 ක් හෝ ඊට වැඩි කාලයක් ගත කරන එක් දිනක් සඳහා රු.500/-ක් ගෙවිය යුතුය.

II. පැයකට වැඩි එහෙත් පැය 04 අඩු කාලසීමාවක් ගත කරන එක් දිනක් සඳහා රු.250/-ක් ගෙවිය යුතුය.

**(ආ) සේවකයන්ගේ දිනක වැටුප රු.700/-ක් හෝ ඊට වැඩිවන්නේ නම්,**

I. දින 04 ක උපරිමයකට යටත්ව, පැය 4 ක් හෝ ඊට වැඩි කාලයක් ගත කරන එක් දිනක් සඳහා දිනක වැටුප ගෙවිය යුතුය.

II. පැයකට වැඩි එහෙත් පැය 4 කට අඩු කාල සීමාවක් ගත කරන එක් දිනක් සඳහා දින භාගයක වැටුප ගෙවිය යුතුය.

**(ඇ)** එක් විනය පරීක්ෂණයක් හෝ තීරක විභාගයක් නිම කිරීම සඳහා ගත කරන කාල සීමාව දින 4 කට වැඩි වන විට හා එසේ වැඩිපුර කාලසීමාවක් ගැනීමට තුඩුදුන් හේතු විනය පරීක්ෂණ නිලධාරී හෝ තීරකයන් විසින් පෙන්නුම් කරනු ලබන විට එම හේතු සාධාරණයැයි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන්නේ නම්, දින 04 ක උපරිමය නොසලකා ගෙවීම් කල හැකිය. එහෙත් මෙවැනි එක් සමිති නියෝජිතයෙක් වෙනුවෙන් මෙම දීමනාව ගෙවිය හැක්කේ මසකට දින පහක (5) උපරිමයකට යටත්වය.

03. සේවකයෙකුගේ දිනක වැටුප ගණනය කිරීමේදී සේවකයාට මාසිකව ගෙවනු ලබන මූලික වැටුප දින 30 න් බෙදා ගණනය කළ යුතුය.

04. මෙම චක්‍රලේඛය 2023.03.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි කොමිෂන් සභාවේ අනුමැතිය මත නිකුත් කරන ලදී.

ජයන්ත ජී. ලියනගේ.
ලේකම්,
සමූපකාර සේවක කොමිෂන් සභාව,
දකුණු පළාත.

පිටපත -
1. ලේකම්, කෘෂිකර්ම,ගොවිජන සංවර්ධන …….. සමූපකාර අමාත්‍යාංශය - දැ.ගැ.ස.
2. සමූපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්, දකුණු පළාත - කරු.සමු.සං.ප්‍රා.නි. හරහා අදාළ සමිති දැනුවත් කිරීම සඳහා.
3. දකුණු පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛ ගොනුවට


ලේකම් / செயலாளர் / Secretary } 091-2232794
පරිපාලන නිලධාරි / நிர்வாக அதிகாரி / Administrative Officer } 091-2234279
කාර්යාලය/ෆැක්ස් / அலுவலகம்/பெக்ஸ் / Office/ Fax } 091-2234383
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site } www.cec.sp.gov.lk
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail } empcommicoopsp@sltnet.lk